# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2016/40 - 2017 අප්‍රේල් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2017.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2017 අප්‍රේල් මස 26 වැනි දින.

**උපලේඛනය**


ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ ගඟබඩ පත්තුවේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වෙරළුගම්පොල 392 A ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, වෙරළුගම්පොල ග්‍රාමයේ පිහිටියා වූ ද පුංචිනැඳුන්ගොල්ල නැමති ඉඩමේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකසන ලද 2017.03.07 දිනැති අංක CEB/NTDND&EIP/P2/LI/L2 දරන දළ සටහන මගින් දැක්වෙන පහත සඳහන් මායිම් සහිත ප්‍රමාණයෙන් පර්චස් 80 ක් වූ අඩි 20 පළල ප්‍රවේශ මාර්ගය.

| | | |
|---|---|---|
| උතුරට | : | සමන් වීරක්කොඩි, කේ. කේ. ඒ. ආරියදාස සහ පද්මිණි ලොකුබාලසූරියට අයත් ඉඩම් ; |
| නැගෙනහිරට | : | පද්මිණි ලොකුබාලසූරියට අයත් ඉඩම සහ ඇල ; |
| දකුණට | : | පද්මිණි ලොකුබාලසූරිය, ඒ. එම්. එස්. ගාමිණිට අයත් ඉඩම් සහ මහහේන පැපිලියවල මාර්ගය ; |
| බටහිරට | : | පද්මිණි ලොකුබාලසූරිය, අරුණ ආරියවංශ සහ කේ. කේ. ඒ. ආරියදාසට අයත් ඉඩම්. |
| හිමිකම් කියන අය | : | පද්මිණි ලොකුබාලසූරිය මිය, අංක 910/10/J, අදිකාරම් වත්ත, ඇතුල් කෝට්ටේ.<br>අරුණ ආරියවංශ මයා, අංක 254/1, වෙරළුගම්පොල, පැපිලියවල. |


1A - G 25485 — 17 (2017/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇමුණුම - 04




05- 357